**ජනතා වතු සංවර්ධන මණ්ඩලය - 2019**

-----------------------------------------------

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් විසින්ම එම අස්ථිත්වය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්වවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්වයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

එසේ වුවද 2003 ජූනි 02 දිනැති පීඊඩී 12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු 2019 වර්ෂයේ පාලක මණ්ඩලයේ විෂයය අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින දක්වාම විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018,2019 හා 2020 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 ගිණුම් පොත්පත් හා ලේඛන පවත්වාගෙන යාම**

-------------------------------------------------

මණ්ඩලයේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණද, සමාලෝචිත වර්ෂයට අදාළ ලෙජර් ගිණුම්, පොත්පත් හා ලේඛන සම්පූර්ණ කර නොතිබුණි.

**2.3 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

-------------------------------------

මණ්ඩලය විසින් අවසන් වරට පිළියෙළ කරන ලද 2017 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **වත්කම්** | **වටිනාකම** |
|---|---|
| --------- | ---------- |
| | **රු.** |
| ජංගම නොවන වත්කම් | 2,218,946,781 |
| ජංගම වත්කම් | 773,294,188 |
| **මුළු වත්කම්** | 2,992,240,969 |
| බැරකම් | |
| ජංගම බැරකම් | 2,322,337,501 |
| ජංගම නොවන බැරකම් | 709,858,954 |
| **මුළු බැරකම්** | 3,032,196,455 |
| ශුද්ධ වත්කම් / අයිතිය | (39,955,486) |
| **මුළු බැරකම්** | 2,992,240,969 |
| | |
| මුළු ආදයම | 1,181,361,157 |
| මුළු වියදම | 1,562,383,680 |
| **ඌනතාවය** | (381,022,523) |

**2.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය - 9.4 ඡේදය | කැබිනට් අනුමැතියකින් තොරව ආයතනයක සේවකයකු අමාත්‍යාංශයකට හෝ වෙනත් ආයතනයකට නිදහස් කිරීමට හෝ එසේ නිදහස්කළ නිලධාරීන්ට ආයතනයෙන් ගෙවීම් නොකළ යුතු වුවත් මණ්ඩලයට අදාළව දේශපාලන පලිගැනීම් කමිටු නිර්දේශය මත වැඩ තහනම්ව සිට නැවත අනියුක්ත කළ නිලධාරියකු 2017 වර්ෂයේ සිට ඇල්කඩුව වැවිලි සමාගමේ "කළමණාකරු- අලෙවි" තනතුරකට පත් කර තිබුණු අතර, මණ්ඩලය විසින් එම නිලධාරියාට වැටුප් වශයෙන් රු.1,798,260 ක මුදලක් 2019 වර්ෂයේ සිට 2020 අගෝස්තු අවසන් වන විට ගෙවා තිබුණි. | දේශපාලන පලිගැනීම් කමිටු නිර්දේශය මත මෙම නිලධාරියාව නැවත ජනවසම සේවය සඳහා අනුයුක්ත කරන ලදී. එම සේවකයා ජනවසම ප්‍රධාන කාර්යාලයේ සේවයේ යෙදවීම සම්බන්ධයෙන් ඇතිවූ වෘත්තීය සමිති විරෝධතා සම්බන්ධයෙන් එම නිලධාරියා රේඛීය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ඇල්කඩුව වැවිලි සමාගම යටතේ සේවය කිරීමට කළමනාකාරිත්වයට සිදුවිය. මෙහිදී ආයතනය තුල තවදුරටත් කාර්මික ආරවුලක් නිර්මාණය කිරීම වැලැක්වීම පිණිස ක්‍රියාත්මක කරන ලදී. ඉන්අනතුරුව වර්තමාන රජය බලයට පත්වීමෙන් පසු ජනවසම හා ඇල්කඩුව වැවිලි සමාගම අමාත්‍යාංශ දෙකක් යටතට පත්වීම නිසා මෙම නිලධාරියා 2020.09.02 දින සිට සේවය සඳහා කැඳවීමට ජනවසම කළමනාකාරිත්වය විසින් කටයුතු කරන ලදී.තවද කැබිනට් මණ්ඩලය වෙතින් ලද තීරණය ක්‍රියාත්මක කළයුතුව තිබූ බැවින් ආයතනයට එවැනි විකල්ප ක්‍රියාමාර්ගයක් ගැනීමට සිදුවිය. | කැබිනට් අනුමැතියකින් තොරව ආයතනයක සේවකයකු අමාත්‍යාංශයකට හෝ වෙනත් ආයතනයකට නිදහස් කිරීම හෝ එසේ නිදහස්කළ නිලධාරීන්ට ආයතනයෙන් වැටුප් ගෙවීම නොකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ජනාධිපති ලේකම්ගේ 2010 පෙබරවාරි 03 දිනැති අංක SP/RD/02/10 දරන රජයේ ඉඩම් කළමණාකරනය පිළිබඳ චක්‍රලේඛයේ 7 ඡේදය | රජයේ ඉඩම් බදු දීම, විකිණීම හා දීමනා පත්‍රයක් මඟින් බැහැර කිරීමේදී වටිනාකම/ බදු මුදල් අය කිරීම් රජයේ තක්සේරුකරුවෙකුගෙන් ලබා ගන්නා තක්සේරුවක් පදනම් කර ගෙන සිදුකළ යුතු වුවද, මොනරාගල කුමාරවත්ත වතුයායේ පාරවිල රබර් ඉඩම බදුදීමේදී රජයේ තක්සේරුකරු වෙතින් වාර්තාවක් ලබාගෙන නොතිබුණි. | ජනාධිපති ලේකම්තුමා විසින් 2010.02.03 නිකුත් කරන ලද එස්පී/ආර්ඩී/02/10 දරන චක්‍රලේඛනය මගින් රජයේ සම්පත් විකිණීමේදී හෝ බදු දීමේදී රජයේ තක්සේරුව ලබා ගත යුතු බව තහවුරු කර ඇති වුවද ආයතනයේ පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් රජයේ තක්සේරුව ලබා ගෙන නොමැත. තවද මෙම ඉඩම් ලබා දීම සඳහා අයදුම්පත් කැඳවා සුදුසු ආයෝජකයා සහ එම ආයෝජකයාට සුදුසු ඉඩම් ප්‍රමාණය හඳුනා ගැනීමෙන් අනතුරුව රජයේ තක්සේරුව ලබා ගත යුතු බැවින් ද ඒ අනුව තක්සේරුව ඉල්ලුම් කර වාර්තා ලබා ගැනීම සඳහා ඉතා දිගු කාලයක් වැයවන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ගන්නා ලද බදු අගයක් පාදක කර ගනිමින් බදු ගිවිසුම් වලට එළඹීමට කටයුතු කර ඇත. එසේ වුවද ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අගතියක් නොවන අයුරින් රජයේ තක්සේරුව මත බදු මුදල් සංශෝධනය කිරීමට අදාල වන්නා වූ කොන්දේසි බදු ගිවිසුම් තුලට අන්තර්ගත කර ඇති බව ගිවිසුම් නිරීක්ෂණයේදී පෙනී යයි | රජයේ ඉඩම් බදු දීම, විකිණීම හා දීමනා පත්‍රයක් මඟින් බැහැර කිරීමේදී වටිනාකම/ බදු මුදල් අය කිරීම් රජයේ තක්සේරුකරුවෙකු ගෙන් ලබා ගන්නා තක්සේරුවක් පදනම් කර ගෙන සිදුකළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මොනරාගල කුමාරවත්ත වතුයායේ පාරවිල කොටසේ 2015 වර්ෂයේදී හෙක්ටයාර 15 ක භූමියක මණ්ඩලය විසින් රබර් වගාවක් ආරම්භකර ඇති අතර 2015 සිට 2019 ඔක්තෝබර් මාසය දක්වා රු.8,346,368 ක වියදමක් දරා තිබුණි. නමුත් මණ්ඩලය හා අදාළ බදුකරු අතර ඇති කරගත් අංක 158 දරන ගිවිසුම් අනුව එම ඉඩම බදු දීම තුළින් වර්ෂ 30 ක කාලයක් පුරා මණ්ඩලය ලබා ගැනීමට අපේක්ෂා කරනු ලබන මුළු බදු මුදල රු.11,423,415 කි. ඒ අනුව මෙම | 2019.09.18 වන දින එවකට සභාපතිතුමා විසින් දන්වා එවන ලද ලිපියට අනුව මෙම ඉඩම් කොටස මුඩු ඉඩමක් ලෙස සලකා ඇති බව පෙනෙන අතර ඒ අනුව රබර් වගාව සැලකිල්ලට නොගෙන බදු මුදල් ගණනය කර ඇත. දැනට පවතින රබර් ගස් ප්‍රමාණය හෝ ඒ මගින් ලබා ගත හැකි ආදායම පිළිබඳ කිසිඳු සැලකිල්ලක් නොදක්වමින් මුඩු ඉඩම්වලට අදාළ වන බදු අගයන් මත මෙම බදු ගිවිසුම අත්සන් කර ඇති හෙයින් මෙම බදු ගිවිසුම අවලංගු කිරීමට වර්තමාන අධ්‍යක්ෂ | මෙම රබර් වගාවද ඇතුළුව මුළු ඉඩම සඳහා තක්සේරු වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව, බදු මුදල සංශෝධනය කර නව ගිවිසුමකට ඇතුළත් විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | භූමිය බදු දීම තුළින් අදාළ වගාව වෙනුවෙන් දරන ලද වියදමට සරිලන ප්‍රතිලාභයක් ලබාගැනීමට හැකිවන සේ ගිවිසුම්ගත වීමට මණ්ඩලය කටයුතුකර නොතිබුණි. | මණ්ඩලයෙන් උපදෙස් ලැබී ඇති අතර එසේ අවලංගු කිරීමේදී බදු කරු විසින් ගෙවා ඇති මිලියන 1.25 ක අත්තිකාරම් මුදල ආපසු ගෙවීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ආයතනය සතුව නොමැති බැවින් මෙම බදු ගිවිසුම අවලංගු කිරීමට අපහසු වී ඇත. එසේ නොවන්නේනම් මෙම රබර් වගාවද ඇතුළුව මුළු ඉඩම සඳහා ඔවුන්ගේ ව්‍යාපෘති වාර්තාවටද සරිලනසේ තක්සේරු වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව ඒ අනුව බදු මුදල් සංශෝධනය කර නව ගිවිසුමකට ඇතුළත් විය යුතුය. | |
| (ආ) | සාර්ථක තේ වගාවක් සඳහා කළ යුතු වඩාත්ම වැදගත් කෘෂිකාර්මික කටයුත්ත වනුයේ තේ තවාන් පවත්වාගෙන යාමයි. තේ තවාන් පාලනයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ, නිසරු හෝ මැරුණු පැළ ප්‍රතිශතය අවම අගයක පවත්වා ගනිමින් ප්‍රදේශයට නිර්දේශිත තේ ප්‍රභේද නියමිත කාල සීමාවක් තුළදී, අවම වියදමකින් ඒකාකාරව හොඳින් වැඩුණු, නිරෝගී මෙන්ම ශක්තිමත් තේ පැළ නිපදවා ගැනීමයි. නමුත් මණ්ඩලයේ වතුයායන් තුළ වර්තමානය වන විට තේ පැළ තවාන් ආරම්භ කර පවත්වාගෙන නොයන අතර, මේ හේතුවෙන් සිටුවීමට අවශ්‍ය පැළ බාහිර පාර්ශවයන්ගෙන් පිරිවැයක් දරා ලබා ගැනීමට සිදු වී තිබෙන බව නිරීක්ෂණය විය. | සාර්ථක තේ වගාවක් සඳහා ප්‍රධාන කෘෂිකාර්මික කටයුත්ත ලෙස තේ පැළ තවාන් ආරම්භ කිරීම බව වර්තමාන කළමණාකාරීත්වයට වැටහී ඇති බැවින් 2021 වර්ෂයේදී අප ආයතනය සතු වතුයායන් 14ක තේ පැළ 1,350,000 ක් පමණ තේ පැළතවාන් ආරම්භ කිරීමට ඇස්තමේන්තු ගත කර ඇති බව දන්වා සිටිමු. මෙමගින් මෙම වර්ෂයේ තේ නැවත වගාවට හා පාළු සිටුවීම වැනි සංවර්ධන කටයුතු සඳහා උපයෝගී කරගත හැක. | සාර්ථක තේ වගාවක් පවත්වාගෙන යාම සඳහා ඒ ප්‍රදේශයට නිර්දේශිත, හොඳින් වැඩුණු හා නිරෝගී තේ ප්‍රභේද වලින් යුතු, තේ පැළ තවාන් අවම වියදමකින් යුක්තව පවත්වාගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා මණ්ඩලය විසින් නිකුත් කරන ලද කාර්ය සාධන වාර්තා අනුව, නිමි තේ කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය, සාමාන්‍ය විකුණුම් වටිනාකම සැසඳීමේදී වතු 16 ක තේ කිලෝග්‍රෑම් එකක දායකය සෘණ අගයක් ගෙන තිබුණ අතර, එය 2017 වර්ෂයේදී රු.100 ත් රු.594 ක් අතර පරාසයකද, 2018 වර්ෂයේදී රු.53 ත් රු.487 ක් අතර පරාසයකද පැවතුන අතර එය 2019 වර්ෂය වන විට රු.573 ත් රු.2109 ක පරාසය දක්වාද සෘණ දායකය ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව තේ කිලෝග්‍රෑම් එකක් විකිණීමෙන් ලැබෙන ආදායමින් ඒ සඳහා වැයවන නිෂ්පාදන පිරිවැය ආවරණය කරගත නොහැකි තත්ත්වයක් දිගින් දිගටම නිරීක්ෂණය විය . | 2019 වර්ෂය සඳහා නිමි තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය ඔබගේ වාර්තාව අනුව නිවැරදි වියයුතු බව සඳහන් කරන අතර (වාර්තාවේ 2019 වර්ෂයේ නිෂ්පාදන පිරිවැය මාසික දත්ත සඳහන් කර ඇත) සමාලොචිත වර්ෂයේ අස්වැන්නේ වර්ධනය නොවීම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය වැඩිවී ඇති බව දන්වා සිටිමි. නියමිත ක්‍රමවේද අනුව පොහොර හා අනෙකුත් කෘෂිකාර්මික මෙවලම් ලබානොදීම හේතුවෙන් තේ දළුවල ගුණාත්මක භාවය හීන වීම හේතුවෙන් විකුණුම් මිල අඩුවී ඇති අතර තේ කර්මාන්තශාලාවල යන්ත්‍ර සූත්‍ර නියමිත පරිදි නඩත්තු කටයුතු නොකිරීමෙන් නිමි තේ සඳහා අඩු මිලක් ලැබී ඇති අතර 2020/2021 වර්ෂවලදී හෝප්, ලෙවලන් හා ලූල්කඳුර යන තේ කර්මාන්ශාලාවල නඩත්තු කටයුතු කරමින් පවතී. විකුණුම් මිලෙහි වර්ධනයක් බලාපොරොත්තු වේ. | තේ කිලෝග්‍රෑම් එකක් විකිණීමෙන් ලැබෙන ආදායමින් ඒ සඳහා වැයවන නිෂ්පාදන පිරිවැය ආවරණය කරගත හැකි වන ආකාරයට, කාර්යක්ෂම අයුරින් තේ නිෂ්පාදනය හා පිරිවැය කළමනාකරණය කර විකුණුම් ආදායම ඉහළ නැංවීමට කළමනාකාරීත්වය වග බලා ගත යුතුය. |
| (ඈ) | වැවිලි අමාත්‍යාංශයේ වැවිලි භෝග සංඛ්‍යා දත්ත අනුව තේ හෙක්ටයාරයක මාසික සාමාන්‍ය ඵලදාව කිලෝග්‍රෑම් 1600 ක් වුවද, 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම මණ්ඩලයේ වතුයායන් සියල්ලෙහිම ඵලදාව ඉතා පහළ මට්ටමක පැවතුන බව නිරීක්ෂණය විය. 2019 වර්ෂයේදී වතුයායන්හි එම අගය කිලෝග්‍රෑම් 335 සිට 733 ක තරම් පහළ පරාසයක් ගෙන තිබුණි. | වැවිලි අංශයේ සංඛ්‍යා දත්ත අනුව හෙක්ටයාරයක ඵලදාය කිලෝ 1600 ක් ලෙස දැක්වුවත් අපගේ ඵලදාය එම තත්වයේ නොතිබීමට හේතුව වසර 15කට වැඩි කාලයක් නිසියාකාර පොහොර භාවිතයෙන් තොර වීමත් ක්ෂේත්‍ර නිසියාකාරව වල් නෙලීමකට ලක් නොකිරීමත් (නඩත්තු නොකිරීම) හා පරිසර සාධකයන් වෙනස්වීම යන හේතුන් මතය. ආයතනය සතුව කාරක ප්‍රාග්ධනය නොතිබීම හේතුවෙන් නැවත වගාවක් හෝ පාලු සිටුවීම සිදු නොවීම මේ සඳහා බලපාන ලද ප්‍රධාන හේතු වේ. | වැවිලි අමාත්‍යාංශයේ වැවිලි භෝග සංඛ්‍යා දත්ත අනුව තේ හෙක්ටයාරයක පැවතිය යුතු මාසික සාමාන්‍යය ඵලදාව පවත්වා ගැනීම සඳහා මණ්ඩලයේ වතුයායන් නිසියාකාරව නඩත්තු කිරීමට සහ නිසිපරිදි පොහෙර යෙදීමට කළමනාකාරීත්වය වග බලා ගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයට අයත් තේ වතු 16ට අදාළ සත්‍ය නිමි තේ තොගය කිලෝග්‍රෑම් 1,371,537 ක් වූ අතර, එය පසුගිය වර්ෂයට සාපේක්ෂව කිලෝග්‍රෑම් 64,232 ක අඩු වීමක් පෙන්නුම් කරන අතර අයවැයගත අස්වැන්නට සාපේක්ෂව කිලෝග්‍රෑම් 702,693 ක අඩුවීමක් නිරීක්ෂණය විය. | ආයතනයේ පැවති මූල්‍යමය අර්බුධය හේතුවෙන් පොහොර හා අනෙකුත් කෘෂිකාර්මික මෙවලම් වතුයායන් වෙත ලබානොදීම හේතුවෙන් අස්වැන්න වාර්ෂිකව අඩුවී ඇති අතර 2020 වර්ෂයේදී 2019 වර්ෂයට සාපේක්ෂව අස්වැන්න 6% පමණ වර්ධනය වී ඇත. | වාර්ෂිකව තේ අස්වැන්න වැඩි කර ගැනීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීම මෙන්ම ඒ අනුව අස්වැන්න වැඩි කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම කළමනාකාරීත්වයේ වගකීම වේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට මණ්ඩලය විසින් පාලනය කරනු ලබන තේ වතු 16 ට අයත් භූමි ප්‍රමාණයේ එකතුව හෙක්ටයාර 10,165 ක් ලෙස තේ වගාවට වෙන් කළ භූමි ප්‍රමාණය පිළිබඳව මණ්ඩලය විසින් පිළියෙල කරන ලද ලේඛනයේ සඳහන්ව තිබුණි. (Hectarage Statement 2019). එම වාර්තාවට අනුව සමස්ත භූමි ප්‍රමාණයෙන් තේ සහ අනෙකුත් වගාවන් සඳහා උපයෝගී කරගෙන ඇත්තේ හෙක්ටයාර 4895.79 ක භූමි ප්‍රමාණයක් පමණි. ගොඩනැගිලි සඳහා වන හෙක්ටයාර 1214 ක භූමි ප්‍රමාණය වෙන්කළ විට හෙක්ටයාර 4054.97 ක භූමි ප්‍රමාණයක් තේ වගාව සඳහා යොදා නොගන්නා බවත් එය සමස්ත භූමි ප්‍රමාණයෙන් සියයට 39.89 ක පමණ ප්‍රමාණයක් වන බවත් මෙම භූමි ප්‍රමාණය වගාව සඳහා උපයෝජනයට මණ්ඩලය සතුව සැලසුමක් නොමැති බවත් නිරීක්ෂණය විය. | වර්ෂ ගණනාවක සිට ආයතනයේ පවතින මූල්‍යමය අර්බුධය හේතවෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලය මඟින් පාලනය වන වතුයායන්හි නැවත වගාව හෝ අළුතින් වගාව කර නොමැති අතර 2017/2018 වර්ෂ වලදී අඩු ඵලදාව සහිත තේ වගාව සහිත භූමි ප්‍රමාණය අඩු කිරීම හේතුවෙන් භූමි ප්‍රමාණයේ වර්ධනයක් සිදු නොවූ අතර , 2021 වර්ෂයේදී එක් වතුයායකට හෙක්ටෙයාර 10 බැගින් වගා කිරීම සඳහා සෑම වත්තකටම තේ පැල තවාන් ආරම්භ කර තේ වගාකර ඇති භූමි ප්‍රමාණය වර්ධනය කිරීම සඳහා කටයුතු කෙරෙමින් පවතී. තවද අනෙකුත් භෝග වගාවන් ද 2021 වර්ෂයේදී ආරම්භ කර ඇති බවද දන්වා සිටිමු. (කරාබු,කෝපි,කුරුඳු, එනසාල් ආදී වගාවන්) | මණ්ඩලයට අයත් භූමි ප්‍රමාණය කාර්යක්ෂමව හා ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කළමනාකාරිත්වය වග බලා ගත යුතු වේ. |
| (උ) | රබර් වගාවට වෙන් කරන ලද භූමි ප්‍රමාණය පිළිබඳව මණ්ඩලය විසින් පිළියෙල කරන ලද ලේඛනය (Hectarage Statement 2019) අනුව, රබර් වගාව සඳහා හෙක්ටයාර 2177 ක් මණ්ඩලය සතුව ඇති නමුත් රබර් වගාව සඳහා හෙක්ටයාර 742 ක්ද අනෙකුත් භෝග සඳහා හෙක්ටයාර 26 ක්ද පමණක් උපයෝජනය කරගෙන තිබූ අතර, හෙක්ටයාර 1408 ක ප්‍රමාණයක් වගාවන් සඳහා යොදාගෙන නොතිබුණි.ඒ අනුව සමස්ත භූමි ප්‍රමාණයෙන් සියයට 64.6 ක රබර් වගාව සඳහා යොදවා ගෙන නොතිබුණි. මේ භූමි ප්‍රමාණය වගාව සඳහා උපයෝජනයට මණ්ඩලය සතුව සැලසුමක් නොතිබූ බව නිරීක්ෂණය විය. | වසර ගණනාවක සිට පැවති මූල්‍යමය අර්බුධය හේතුවෙන් රබර් නැවත වගාව හෝ අලුතින් වගාවකර නොමැති බැවින් භූමි ප්‍රමාණයේ වර්ධනයක් සිදුනොවූ අතර , 2021 වර්ෂයේදී එක් වතුයායකට හෙක්ටයාර 10 බැගින් වගා කිරීම මගින් දුර්වල තත්වයේ පවතින රබර් වගාව ඉවත් කර නැවත වගා කිරීමට බලාපොරොත්තු වේ. | මණ්ඩලයට අයත් භූමි ප්‍රමාණයන් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස උපයෝජනය වන අයුරින් සැලසුම් සකස් කිරීම හා සැලසුම් මුදුන් පත් වන ආකාරයට කටයුතු කිරීම කළමනාකාරිත්වයේ වගකීම වේ. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | හෙක්ටයාර් 604 ක් වන මණ්ඩලයට අයත් රබර් වගා කර ආදායම් උපයාගන්නා ඉඩම් ප්‍රමාණයෙන් ගුණාත්මක හා මධ්‍යස්ථ තත්වයේ පැළ පවතින ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 322 ක් පමණක් විය. හෙක්ටයාර් 282 ක ප්‍රමාණයක එලදාව අඩු තත්ත්වයේ රබර් පවතින බැවින් හෙක්ටයාර 282 ක භූමි ප්‍රමාණයක් ඌන උපයෝජනය වී පවතින බව නිරීක්ෂණය වේ. එය ආදායම් උපයා ගන්නා මුළු ඉඩම් ප්‍රමාණයෙන් සියයට 47 ක් පමණක් වී තිබුණි. ඒ අනුව දියළුම වත්තේ රබර් වගාකර ආදායම් උපයාගන්නා බිම් ප්‍රමාණයෙන් සියයට 89 ම එලදාව අඩු තත්වයේ රබර් පවතින බව නිරීක්ෂණය වේ. | රබර් වගා කර ඇති ඉඩම් ප්‍රමාණය මුලු හෙක්. ප්‍රමාණයෙන් 50% ක් පමණ විමත් එයිනුත් සැලකියයුතු ප්‍රමානයක් එලදාය අඩු වීමට හේතුවත් නිසි පරිදි ක්ෂේත්‍ර වලට පොහොර යොදා නඩත්තු නොකිරීමත් යහපත් කෘෂි කාර්මික පුරුදු වලට අනුගත නොවීමත්ය. ක්ෂේත්‍ර නඩත්තු නොකිරීම හා වගා නොකරන ලද ඉඩම් නැවත වගාව සඳහා ආයතනය සතුව කාරක ප්‍රාග්ධනය නොතිබීම හේතුවෙන් නැවත වගාව හා නඩත්තු කිරීම සිදු වී නොමැත. මෑතකදි ඇති වී ඇති ප්‍රගතියක් සමග 2021 වර්ෂයේ ඌන සංවර්ධිත ක්ෂේත්‍ර සැලකිය යුතු පරිදි නඩත්තු කිරීමත් නැවත වගා කිරීමටත් සැලසුම් කර ඇත. | වගාවන් නිසි පරිදි නඩත්තු කිරීමත්, ඉඩම් ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමත් කළමනාකාරිත්වය සතු වගකීමක් වේ. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ පොහොර අවශ්‍යතාවය අනුව ඇස්තමේන්තුගත පොහොර වියදම රු. 61,673,682 ක් වුවද පොහොර සඳහා සමාලෝචිත වර්ෂය තුළ දරා තිබුණු සත්‍ය වියදම රු.2,073,745 ක් විය. කාලීනව අවශ්‍ය පොහොර ප්‍රමාණය නොයෙදීම හේතුවෙන් බීජ පැළවල හා තේ දළුවල ගුණත්වය පහත වැටීම මත නිමි තේ සඳහා ඉල්ලුම අඩුවීමේ අවදානම පවතී. 2019 වර්ෂයේ වතු 15 න් වතු 03 ක් සඳහා පමණක් පොහොර වෙනුවෙන් වැයකළ සත්‍ය වියදම අයවැයගත වියදමේ ප්‍රතිශතයක් ලෙස සියයට 03 ක පමණ පහළ මට්ටමක පැවතුණි. | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තු සකස් කල ද ආයතනයේ පැවති මූල්‍යමය අර්බුධය හේතුවෙන් පොහොර යෙදවීම සීමා වී ඇති නමුත් බාහිර පාර්ශවයන්ට අමුදළු ලබාදෙන ඉන්සයිට් පුද්ගලික සමාගම මඟින් බෝහිල්, කොළපතන හා මහවිල යන වතුයායන්ට කොටස් වශයෙන් ගෙවීමේ පදනම මත පොහොර ලබා දී ඇත. 2021 වර්ෂයේ නියමිත පරිදි පොහොර යෙදවීමට බලාපොරොත්තු වේ | වගාවන් තුළින් නිසි ඵලදාව ලබා ගැනීම සඳහා පොහොර යොදා කාලීනව වගාවන් නිසි පරිදි නඩත්තු කළ යුතුය. |

### 3.2 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | MM 1-1 වැටුප් කාණ්ඩයට අයත් ගණකාධිකාරී, මානව සම්පත් කළමනාකරු, නීති කළමනාකරු, කළමනාකරු (වන), අභ්‍යන්තර විගණක යන තනතුරු දරන නිලධාරීන් හය දෙනෙකුට මාසිකව ප්‍රවාහන දීමනාව ලෙස රු.50,000 | උක්ත ලිපියේ දක්වා ඇති නිලධාරීන් 6 දෙනෙකු සඳහා ප්‍රවාහන දීමනාව හා ඉන්ධන දීමනාව පිළිබඳ වාර්තා කර ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ඉන්ධන හා ප්‍රවාහන දීමනා සම්බන්ධ චක්‍රලේඛන යටතේ MM 1-1 ශ්‍රේණියේ නිලධාරීන්හට ප්‍රවාහන දීමනාව හිමි නොවන බව දක්වා ඇත. එහෙත් පහත සඳහන් හේතූන් මත ජනතා වතු සංවර්ධන | පවත්නා නීති රීති අභිබවා ක්‍රියානොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | බැගින් සහ එක් එක් තනතුර සඳහා තීරණය කරන ලද ඉන්ධන ලීටර ප්‍රමාණයක් සඳහා දීමනාවක්ද ඇතුළුව 2019 වර්ෂය තුළදී රු. 4,603,760 ක මුදලක් ගෙවා තිබුණි. මෙම ගෙවීම 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 5 සහ 8 වගන්ති යටතේ සිදුකළ බව දක්වා තිබුණද, එම වගන්තිවල මෙවැනි දීමනා ගෙවීම පිළිබඳ නිශ්චිත තොරතුරු ඇතුළත්ව නොතිබුණි. | මණ්ඩලය පිහිටවූ 1972 අංක 11 දරන කෘෂිකාර්මික පනතේ විධිවිධානයන්ට අනුකූලව මෙම ආයතනයේ එකී නිලධාරීන් සඳහා ප්‍රවාහන දීමනාව ලබාදීමට ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කටයුතු කර ඇත. එකී පණතේ 5.b, 5.e, 8.8 (1) (b), 8.1 (b) උප වගන්තිය යටතේ එවැනි තීන්දු තීරණ ගැනීමේ හැකියාවක් මෙම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හිමි වී ඇත. ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2011.08.03 දිනැතිව අනුමත කරන ලද සේවක සංඛ්‍යා සැලැස්ම, අනුමත කිරීමටත් ප්‍රථම සේවයේ යෙදී සිටි නිලධාරින්ට හා ඉන්පසුව සේවයට බඳවාගන්නා නිලධාරීන්ට මෙම දීමනාවන් කළමනාකරුවන්ගේ වැටුප් විෂමතා අවම කිරීමට අවස්ථානුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සේවා අවශ්‍යතාවය මත අනුමැතිය ලබාදී ඇත. | |
| (ආ) | කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති නිෂ්පාදන උපදේශකවරයකුට මාසිකව රු.50,000 බැගින් රු.476,667 ක ප්‍රවාහන දීමනාවක් ද, එම නිලධාරියා ඇතුළුව වැවිලි කළමනාකරු සහ නිෂ්පාදන උපදේශක තනතුරු සඳහා බඳවාගත් තවත් කොන්ත්‍රාත් නිලධාරීන් දෙදෙනෙකු සඳහා රු.410,400 ක ඉන්ධන දීමනාවක්ද සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. මෙම ගෙවීම 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 5 සහ 8 වගන්ති යටතේ සිදුකළ බව දක්වා තිබුණද, එම වගන්තිවල මෙවැනි දීමනා ගෙවීම පිළිබඳ නිශ්චිත තොරතුරු ඇතුළත්ව නොතිබුණි. | එම සේවකයින් බඳවාගැනීම සඳහා ප්‍රධාන වශයෙන් ඉවහල් වී තිබුණේ පවත්නා රාජකාරීන්/යෝජිත ව්‍යාපෘති ආශ්‍රිත රාජකාරීන් නිසි පරිදි ඉටුකිරීම සඳහා සේවයේ යොදවා සිටින සේවකයින්හට එකී කාර්යයන් ඉටුකිරීමේ හැකියාවක් නොමැති කමත්, ඒ සම්බන්ධව සේවකයින් යොදවාගැනීමට ආයතනය තුල සේවකයින් නොමැතිවීමත්, 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික පනතේ විධි විධානයන්ට අනුව ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු බලතල ප්‍රකාරව ඔවුන් කටයුතු කර ඇති බවය.තවද ඔවුන්ගේ වැටුප් හා වේතන තීරණය කිරීමද එම බලතල වලට ප්‍රකාරව සිදුව ඇත. | බඳවා ගැනීම් පරිපාටියට අනුකූල වන ලෙස කටයුතු කිරීමට කළමනාකරණය වග බලා ගතයුතුය . |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශයේ නිලධාරීන්/සේවකයින්ට 2017 හා 2018 වර්ෂවල පමණක් ආසන්න වශයෙන් රු.මිලියන 22 ක පිරිවැයක් වැටුප් දීමනා හා ප්‍රතිලාභ සඳහා මණ්ඩලයට දැරීමට සිදුව තිබු අතර, මීට අමතරව කාර්යාල පවත්වා ගැනීමේ වියදම්ද දැරීමට සිදුවේ. නමුත් ගිණුම් අංශයේ වගකීම වන කලට වේලාවට මූල්‍ය ප්‍රකාශන | 2019 ජූලි 12 දිනැති 2019/05/ගිණුම්/අ.ම.ප.37 අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව රන්වත්ත සහ සමාගමට ගිණුම් සැකසීම පිරිනැමීම සිදුකරන ලදී. මෙයට අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිවෙකුගේ අකමැත්ත ප්‍රකාශ වී නොමැති අතර එකල සිටි පාලනාධිකාරිය ගත් තීරණයක් මත මෙම ගණකාධිකාරි ආයතනය තොරාගෙන ඇත. කෙසේ වෙතත් මේ වන විට මෙම ආයතනය විසින් 2017 ගිණුම් සකස්කොට අපවෙත ලබාදී ඇත. මේ වනවිට 2017 මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් | ගිණුම් අංශයේ පවතින අකර්යක්ෂමතාවයන් හඳුනාගෙන ඒවාට පිළියම් යෙදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම නිසා රු.1,000,000 ක ගාස්තුවක් ගෙවමින් පුද්ගලික ගණකාධිකරණ සමාගමකට එම වගකීම පවරා තිබුණි. 2017 සහ 2018 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන පිළිවෙලින් 2018 පෙබරවාරි 28 සහ 2019 පෙබරවාරි 28 දින පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එම කාලසීමාවන් ඉක්මවා වර්ෂයේ සිට වර්ෂ දෙක දක්වා කාලපරිච්ඡේදයක් ගතවීමෙන් පසුව එක් එක් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළීයෙල කිරිම සඳහා 2019 ඔක්තෝබර් 01 දින පුද්ගලික ගිණුම්කරණ සමාගම් වෙත ලබා දී තිබුණි. එය තීරණ කලට වේලාවට නොගැනීමක් සහ කළමනාකරණ අකාර්යක්ෂමතාවයක් ලෙසද නිරීක්ෂණය කෙරේ. | කොට ඇත. | |
| **(ආ)** | 2017 සහ 2018 වර්ෂවල හිග මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ කාර්යය සඳහා පුද්ගලික ගණකාධිකරණ සමාගමක් තෝරාගැනීමේදී රු.200,000 ක අවම ලංසුවක් ප්‍රතික්ෂේප කර රු.1,000,000 වැඩිම ලංසුව තෝරාගැනීම තුළින් මණ්ඩලයට රු.800,000 ක අලාභයක් සිදු වී තිබුණි. වැඩිම ලංසුව තෝරා ගැනීමට හේතුව පැහැදිලි කර නොතිබුණු අතර, තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවට සාමාජිකයන් තිදෙනෙක් අතරින් එක් සාමාජිකයෙක් පමණක් අත්සන් තබා තිබුණු බවද නිරීක්ෂණය විය. | තව ද ලංසු ලිපිගොනුව අනුව GMS ඇසෝසියේෂන් ආයතනය ඉදිරිපත් කල මිල ගණන් වන්නේ වසර දෙක සඳහාම රු.1,500,000/- කි. මිල ගණන් අනුව දෙවැනි තැන සිටින ආයතනය තොරාගෙන ඇත. ටෙන්ඩර් විවෘත කිරීමේ කමිටුව මගින් එය වැරදි සහගතව වසර දෙක සඳහා රු 1,500,000/-ක් ලෙස නිවැරදි විය යුතුය. SBN ඇසොසියේෂන් ආයතනය හා රන්වත්ත සමාගම යන ආයතන වල ක්‍රමවේද සැසදීම අනුව එම ආයතනය තොරාගෙන ඇත. කමිටු වාර්තාව එක කමිටු සාමාජිකයෙකු පමණක් අත්සන් කොට ඇති බව පිලිගනිමි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතුය. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ දේපළ හතකට අදාළව කොළඹ නගර සභාව විසින් යොමු කරන ලද වරිපනම් තක්සේරු වාර්තා අනුව 2019 දෙසැම්බර් 31 දිනට හිග වරිපනම් මුදල රු.33,728,663 ක් වේ. තවද, | ඔබගේ නිරීක්ෂණ සටහනට මණ්ඩලය එකඟ වේ. ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ දිගින් දිගටම පැවති මූල්‍ය අර්බුදය නිසා නියමිත වර්ෂ වල ගෙවීම් නියමිත පරිදි සිදුවී නොමැත එසේ වුවද,55. /39 වරිපනම් අංකය සඳහා 2019.10. 30 වන දින රු. 8,264,758.80 ක මුදලක් ගෙවා ඇත.<br>බදු දී ඇති පරිශ්‍රයන් වෙතින් වාර්ෂිකව ලැබිය යුතු | තක්සේරු වාර්තා අනුව පළාත්පාලන ආයතන වෙත වරිපනම් බදු මුදල් නියමිත පරිදි ගෙවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මෙම දේපළ අතරින් බදු දුන් පරිශ්‍රයන් වෙතින් වාර්ෂිකව ලැබෙන මුළු බදු මුදල රු. 41,003,896 සහ වාර්ෂිකව ගෙවිය යුතු මුළු වරිපනම් මුදල රු.5,647,488 ක් බව නිරීක්ෂණය විය. ඒ අනුව ප්‍රමාණවත් මුදලක් බදු මුදල් වශයෙන් එකතු කරනු ලැබුවත් මණ්ඩලය විසින් වරිපනම් මුදල අදාළ පළාත්පාලන ආයතන වෙත ගෙවීම පැහැර හැර ඇති බව නිරීක්ෂණය විය. | බදු මුදල රු. 41.003,896 ක් ලෙස පෙන්වා ඇතත්,එකී බදුගිවිසුම් වල පවතින දෝෂ හා බදු ගැණුම්කරුවන් නිසි පරිදි බදුගෙවීම් සිදුකර නැත. එසේ වුවත් පිලිතුරු 1 හා 2 ට අනුව ආයතනයේ පවතින දැඩි මූල්‍ය අර්බුදය නිසා ගෙවීම් සිදුකර නොමැත.එනමුත් ඉදිරියේදී හැකිතාක් දුරට වාර්ෂික තක්සේරු වටිනාකම් කාර්තුමය වශයෙන් ගෙවීමට සුදුසු ක්‍රියා මාර්ග ගන්නා බව කාරුණිකව දැනුම් දෙමි | |
| (ආ) | නාවලපිටිය පිහිටි කන්දල් ඔය වතුයායෙහි පවතින තේ කර්මාන්ත ශාලාව 2003 වර්ෂයේ සිට අක්‍රීය තත්වයේ පවතින නමුත් එහි එවකට සිටි තේ කර්මාන්ත ශාලා යන්ත්‍ර ශිල්පියා වෙනත් කර්මාන්ත ශාලාවක් වෙත අනුයුක්ත කර නොතිබුණි. අක්‍රීය කර්මාන්ත ශාලාව සඳහා යන්ත්‍ර ශිල්පි තනතුරක් අවශ්‍ය නොවන නමුත් මෙම සේවකයා මෙම කර්මාන්ත ශාලාව වෙත අනුයුක්ත කර තිබුණි. ඔහු සඳහා 2003 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු.4,162,439 ක අනාර්ථික වේතනයක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. වර්තමානය වන විටද එම සේවකයා අක්‍රීය කර්මාන්ත ශාලාව වෙත අනුයුක්ත කර ඇති බව නිරීක්ෂණය විය. | සහකාර තේ කර්මාන්තශාලා යන්ත්‍ර ශිල්පි ලෙස කටයුතු කරන අයිකන්දල්ඔය එම්.ජනදාස මහතා. රාජකාරි සහ අනෙකුත් කාර්යාලවතුයායේ ක්ෂේත්‍ර වාකටයුතු සඳහා යොදාගෙන ඇති බව දන් සිටිමු. | මෙම සේවකයා වෙනත් කර්මාන්ත ශාලාවක් වෙත අනුයුක්ත කර රාජකාරි කටයුතු ඉටුකර ගැනීමට කල යුතුය |

**3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 සහ 2018 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන නීත්‍යානුකූලව පිළියෙල කර ඉදිරිපත් කළයුතු දින ඉක්මයාමෙන් පසුව මණ්ඩලය විසින් 2019 ඔක්තෝබර් 01 දින මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා පුද්ගලික ගිණුම්කරණ ආයතනයක් ප්‍රසම්පාදනය කිරීමට | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව ලංසු කරුවන් තෝරා ගැනීම මණ්ඩලය මගින් සිදුකර ඇති අතර Yellow pages හි Rainbow Pages මගින් වෘත්තීය ගණකාධිකාරි ආයතන සොයාගෙන ලංසු කැඳවා ඇත. 2019ජුනි 24 දින ටෙන්ඩර්පත්වල අවසන් වේලාවට ප්‍රථම මෙම තීරණය සභාපති විසින් දැනුම් දී ඇත. මීට හේතුව ප්‍රමාණවත් ලංසු | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| කටයුතු කර තිබුණු අතර, මෙම ප්‍රසම්පාදන කටයුතු පරීක්ෂා කිරීමේදී මිල ගණන් විවෘත කිරීමේ අවස්ථාවට පැමිණ සහභාගී වන ලෙස ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සංග්‍රහයේ 6.3.3 (ආ) වගන්තිය පරිදි ලංසුකරුවන්ට ආරාධනා කොට නොතිබූ බව නිරීක්ෂණය විය. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 වගන්තිය පරිදි ලංසු ප්‍රසිද්ධියේ විවෘත කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි | ප්‍රමාණයක් ඒ වන විටත් නොලැබීමයි. දින 04 කින් කල් දැමීම පිලිබඳව සැපයුම් අංශය මගින් ලන්සු කරුවන්ට දැනුම් දී නොමැති අතර ඉදිරියේදී එවන් අඩුපාඩු සකස් කර ගැනීමට පියවර ගනිමි.<br>මිල ගණන් විවෘත කිරීම ප්‍රසිද්ධියේ කිරීම අත්‍යාවශය අංගයක් නොවන අතර 2020/06/24 දින ලංසු කරුවන් ආයතනය වෙත පැමිණ නැත. | |

## 3.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතුව පවතින තේ කර්මාන්ත ශාලා 15 ක් හා රබර් කර්මාන්තශාලා 02 ක් පවතින අතර මින් දෛනික නිෂ්පාදන ධාරිතාවය කිලෝග්‍රෑම් 77,000 ක් වූ තේ කර්මාන්තශාලා 8ක් වර්තමානය වන විට අක්‍රියව පවතින අතර, දෛනික නිෂ්පාදන ධාරිතාව ලීටර් 3000 ක් වන රබර් කර්මාන්තශාලා දෙකක්ද වර්තමානය වන විට අක්‍රියව පවතින බව නිරීක්ෂණය විය. | තේ හා රබර් කර්මාන්ත ශාලාවන්හි ධාරිතාවන් පිළිබඳ තොරතුරු මෙම ඇමුණුමෙහි සඳහන් කර ඇත. | කර්මාන්තශාලා වන්හි උපරිම ධාරිතාවය ප්‍රයෝජනයට ගැනීමට කළමනාකාරිත්වය වග බලා ගත යුතුය. |

## 3.7 කාර්යය මණ්ඩල පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුමත කාර්යය මණ්ඩලය හා බඳවාගැනීමේ පරිපාටිය අනුව මණ්ඩලයේ මානව සම්පත් කළමණාකරු හා කළමණාකරු (නීති) MM 1-1 වැටුප් තලයේ පිහිටුවිය යුතු වුවත්, 2017 අප්‍රේල් 01 දිනැති මෙම නිලධාරීන්ගේ පත්වීම් ලිපි අනුව HM 1-1 | ඔවුන් දෙදෙනා අදාළ සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලබා ඇති බවද වාර්තා කරමි. එසේ සුදුසුකම් හා පලපුරුදු අයදුම්කරුවන් දෙදෙනෙකු සාමාන්‍ය ආධුනිකයෙකු බඳවාගන්නා වැටුප් හා දීමනා යටතේ බඳවාගැනීමට නොහැකිවීම නිසා ක්ෂේත්‍රයේ ප්‍රායෝගික වැටුප් තලයන්හි පිහිටුවීමට කළමනාකාරිත්වය කටයුතු කර ඇත. | කළමනාකාරිත්වය බඳවාගැනීමේ පරිපාටිය අනුව ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වැටුප් තලයේ 10 වන පියවරේ පිහිටුවා මණ්ඩලයේ සභාපතිවරයා විසින් පත්වීමේ ලිපියක් නිකුත් කර, පත්වීම් දිනයේ සිට 2019 දෙසැම්බර් දක්වා රු.3,937,668 ක නීත්‍යානුකූල නොවූ වැටුපක් ගෙවා තිබුණි. මෙම ගෙවීම 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 5 සහ 8 වගන්ති යටතේ සිදුකළ බව දක්වා තිබුණද, එම වගන්ති වල මෙවැනි දීමනා ගෙවීම පිළිබඳ නිශ්චිත තොරතුරු ඇතුළත්ව නොතිබුණි. | ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ආයතනය ස්ථාපිත කරන ලද 1972 අංක 11 දරණ කෘෂිකාර්මික පණත මගින් ලැබී ඇති බලතල ප්‍රකාරව (5.b, 5.e, 8.8(1) (b), 8.1 (b) ) යටතේ පණත මගින් ලැබී ඇති බලතල ප්‍රකාරව විධිමත් අනුමැතීන් ඒ සඳහා ලබාදී ඇත. | |
| (ආ) | ආයතන සංග්‍රහයේ දෙවන පරිච්ඡේදයේ 6 වන උප වගන්තියේ නියමයන්ට පටහැනිව අනුමත කාර්යය මණ්ඩලය තුළ නොමැති තනතුරක් වන “කළමණාකරු (වන) ” තනතුර සඳහා 2017 ජනවාරි 01 දින සිට එවකට සහකාර වතු අධිකාරිවරයකු පත් කර සමාලෝචිත වර්ෂය තුළ පමණක් රු.611,329 ක නීත්‍යානුකූල නොවූ දීමනාවක් ගෙවා තිබුණි. | ***කළමනාකරු - වන සම්පත්***<br><br>විමසුමෙහි දක්වා ඇති කරුණු සත්‍ය වුවත් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලැබී තිබූ බලතල මත පහත සඳහන් සේවා අවශ්‍යතාවය මත නිළධාරියෙකු කළමනාකරු - වන සම්පත් තනතුරට බඳවාගැනීමට ආයතනය කටයුතු කර ඇත. | අනුමත කාර්යය මණ්ඩලය තුළ නොමැති තනතුරක් වන හෙයින් අදාළ තනතුර අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2011 අගෝස්තු 03 දින අංක ඩීඑම්එස්/ඊ3/34/4/218/1(Vol-1) දරන ලිපිය මගින් ජනතා වතු සංවර්ධන මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය කාර්යමණ්ඩල අනුමත කර තිබුණි. නමුත් එම අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් නොවූ තනතුරු හයක් සඳහා නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු අතර, එම නිලධාරීන් සඳහා 2018 හා 2019 වර්ෂවලදී පමණක් රු.7,849,074 ක වැටුප් හා | **අනුමත නොකළ තනතුරු සඳහා පත්වීම් ලබාදීම**<br><br>2011 වර්ෂයේ සැලසුම් කරන ලද සේවක සංඛ්‍යා සැලැස්ම 2017 වර්ෂය පමණ කාලය වනවිට ආයතනයේ අත්‍යාවශ්‍ය රාජකාරීන් හා අනෙකුත් ප්‍රතිසංවිධානමය කාර්යයන්/විශේෂ ව්‍යාපෘතීන් මගින් කිරීමට අපේක්ෂා කරන ලද කාර්යයන් සාර්ථක කරගැනීම සඳහා සුදුසු සේවකයින් උක්ත සේවක සංඛ්‍යා සැලැස්මේ ඇතුළත් තනතුරුවල ඇතුළත්ව නොතිබීම නිසා ආයතනයට ගැලපෙන ආකාරයේ ප්‍රායෝගික සේවක සංඛ්‍යා සැලැස්මක කෙටුම්පතක් සකස්කර එවකට ජනතා වතු සංවර්ධන මණ්ඩලය අයත්ව තිබූ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය වෙත වාර්තා කිරීමෙන් අනතුරුව මේ පිළිබඳව සාකච්ඡාවක් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේදී රේඛීය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද කාර්යමණ්ඩල තනතුරු හා සේවක සංඛ්‍යාවන් පමණක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. අතවශ්‍ය වෙනත් තනතුරු වේ නම් අනුමත කර යුතුය |

| | | | |
|---|---|---|---|
| | දීමනා ගෙවා තිබුණි. | අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ හා ආයතනයේ නිළධාරීන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර එහිදී තීරණය වූයේ පවත්නා සේවක සංඛ්‍යා සැලැස්මේ සංශෝධනයන් කිරීමට ප්‍රථම ඊට අදාල බඳවාගැනීමේ පටිපාටීන් සකස්කර ඉදිරිපත් කරන ලෙසයි. ඒ අනුව එකී බඳවාගැනීම් පටිපාටීන් සකස්කර අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඊට අදාල අනුමැතිය ලබාගැනීමට ආයතනය විසින් කටයුතු කරන ලදී. | |
| (ඈ) | 2017 දෙසැම්බර් 19 දින වැඩ තහනමට ලක් වූ කණිෂ්ඨ විධායක නිලධාරිණියකට 2017 දෙසැම්බර් 29 දින චෝදනා පහකින් යුතු චෝදනා පත්‍රයක් නිකුත් කර තිබුණු අතර, ඊට අදාළව රු.114,895 ක වියදමක් දරා සිදු කරනලද විධිමත් විනය පරීක්ෂණයේදී එම නිලධාරිණිය චෝදනා පහටම වැරදිකරු ලෙස 2019 මාර්තු 11 දින රැස් වූ විනය පරීක්ෂණ කමිටුව තීරණය කර තිබුණි. නමුත් 2019 මාර්තු 26 දින පැවති දෙවැනි අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව අනුව මෙම නිලධාරිණිය චෝදනා නොතකා හිග වැටුප් සහිතව නැවත සේවයේ පිහිටුවීමට තීරණය කර ඇතත් එයට හේතුව දක්වා නොතිබුණි. | **විනය පරීක්ෂණ නියමයන් ඉක්මවා කටයුතු** කිරීම ඉහත නම් සඳහන් නිලධාරිනිය විසින් එවකට සේවයේ සිටි සභාපති වෙත යොමුකරන ලද අභියාචනයක් මත පදනම්ව ඇයගේ ක්‍රියාකලාපය හේතුවෙන් ආයතනය වෙත මූල්‍ය අලාභයක් සිදුවී නොමැති හෙයින් ඇයගේ වැටුප් හා දීමනා නිදහස් කිරීමට මෙම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබිණ. ඒ අනුව ඇයට එකී සහන ලබාදීමට ආයතනය විසින් කටයුතු කරන ලදී. | විනය පරීක්ෂණ නියමයන් ඉක්මවා කටයුතු නොකිරීමට කළමනාකාරීත්වය වග බලා ගත යුතුය. |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1** **වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දින නිකුත්කරන ලද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 12 හි 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ගතවීමට පෙර මණ්ඩලයන්හි මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වුවද ආසන්න වර්ෂ 5 තුළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී වර්ෂ කිහිපයක් ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය විය. 2021 පෙබරවාරි 15 දින වන විටද 2018 හා 2019 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත්කර නොතිබුණි | 2021 පෙබරවාරි 15 වන දින වන විට 2018 හා 2019 යන වර්ෂ වල මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත.එසේම 2020 වසරේ මූල්‍ය ප්‍රකාශන 2021 මාර්තු මස අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට යොමු කරද ඇත.2017 වසරේ ගිණුම් සඳහා ජාතික විගණන කාර්යාලය වෙත යොමු කිරීමට නියමිතය. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 12 හි 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ගතවීමට පෙර මණ්ඩලයන්හි මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමට කළමනාකාරිත්වය කටයුතු කළයුතුය |